# අන්තර්ජාතික ශිෂ්‍යයන්ට ගෙවල් කුලියට ගැනීමේ අයිතිය ඇත

මෙම තොරතුරු පත්‍රිකාවෙහි ගෙවල් කුලියට ගැනීම පිළිබඳ තොරතුරු ඇතුළත් වන අතර අන්තර්ජාතික ශිෂ්‍යයන්ට අවශ්‍ය උපදෙස් ඇතුළත් වේ. වැඩි විස්තර සඳහා consumer.vic.gov.au/internationalstudents වෙබ් අඩවියට පිවිසෙන්න.

## බදු ගිවිසුමක් ආරම්භ කිරීම සහ අවසන් කිරීම

- බදු ගිවිසුමකට අත්සන් කිරීමෙන්, එය ආරම්භ වන දිනයේ සිට අවසන් වන දිනය දක්වා කුලිය ගෙවීමට ඔබ එකඟ වන අතර ගිවිසුමෙහි ඇතුළත් සියලු කොන්දේසි අනුගමනය කිරීමට ඔබ එකඟ වේ.
- බදු ඔප්පුවකට අත්සන් කළ යුත්තේ ඔබ එය මනාව තේරුම් ගැනීමෙන් පසුව පමණි. ඔබට එය නොතේරේ නම්, විශ්වාෂවන්ත කෙනෙකු ලවා එය තේරුම් කරවා ගන්න.
- බද්ද අවසන් වීමට කලින් ඔබට නිවෙසින් ඉවත්ව යාමට අවශ්‍ය නම් ඒ බව ඔබේ ගෙවල්හිමියා හෝ දේපළ වෙළඳ නියෝජිතයා සමඟ කතා කළ යුතුය - නියමිත දිනට කලින් බද්ද අවලංගු කිරීමට ඔවුන් එකඟ නොවුවහොත් ඔබට අමතර මුදලක් ගෙවීමට සිදු වනු ඇත. බදු කාල සීමාව අවසානයේදී ඔබ ඉවත්ව යන්නේ නම්, බදු කාලසීමාව අවසන් වීමට මසකට පෙර ඔබ ඉවත්ව යන බව ගෙවල්හිමියාට හෝ දේපළ වෙළඳ නියෝජිතයාට දැනුම් දිය යුතුය.
- ඔබ ඔබේ සියලුම බිල්පත් මෙන්ම අවසන් කුලියද ගෙවිය යුතු අතර, නිවසද පිරිසිදු කළ යුතුය, එසේම ඔබට අයත් සියලුම දෑ රැගෙන යා යුතුය. ඔබේ බදු ගිවිසුමෙහි ඇතුළත් වන්නේ නම් පමණක් නිවසේ බුමුතුරුණු වාෂ්ප ශෝධනයට (steam clean) ලක් කරන්න.

## ඇප මුදල්

- ඔබේ නිවෙස් හිමියා ඇප මුදලක් ගෙවන ලෙස ඉල්ලා සිටිය හැකිය - එය ගෙවල් බද්දට/කුලියට ආරක්ෂණයක් වේ.
- ඔබේ බදු ගිවිසුම අවසන් වන තුරු නේවාසික කුලීකරුවන්ගේ ඇප මුදල් අධිකාරිය (RTBA) මෙම ඇපය තමන් සන්තකයෙහි තබා ගනියි.
- ඔබේ ගෙවල් කුලිය සතියකට $350කට වඩා අඩු නම්, ඔබේ ඇප මුදල විය යුත්තේ මසක ගෙවල් කුලියට වඩා වැඩි විය නොහැක.
- ඔබේ ඉඩම් හිමියා හෝ දේපළ වෙළඳ නියෝජිතයා ඇප මුදල් භාර දීමේ ආකෘති පත්‍රයකට අත්සන් කළයුතු බව ඔබට දන්වනු ඇත. එය අත්සන් කළ යුත්තේ නිවැරදි නම් පමණි. හිස් ආකෘති පත්‍රයකට අත්සන නොයොදන්න.
- බදු ගිවිසුමේ ඇතුළත් සියලු කරුණු නිසි පරිදි ඉටු කරන්නේ නම්, ඔබට ඔබේ ඇප මුදල ආපසු ලබා ගත හැකිය.




## තත්ව වාර්තාව

- ඇප මුදලක් ගෙවන්නේ නම්, ඔබ නිවසේ පදිංචියට පැමිණීමෙන් දින තුනක් ඇතුළත තත්ව වාර්තාවක් සම්පූර්ණ කළ යුතුය. මෙම ලියවිල්ල ඔබ අත්සන් කරන අවස්ථාව වන විට අදාළ කුලී නිවසෙහි ඇති තත්වය පෙන්නුම් කරයි.
- තත්ව වාර්තාව හොඳින් කියවන්න, එය නිවැරදිදැයි බලන්න. වාර්තාවෙහි අඩංගු යමක් වැරදි නම්, ඔබට එය වෙනස් කළ හැකිය.  උදාහරණයක් ලෙස, යමක් අපිරිසිදු නම් හෝ, කැඩී බිඳී ඇත්නම් හෝ ක්‍රියා නොකරන්නේ නම්, ඒ බව ඔබට වාර්තාවෙහි ලියන්න.
- ඔබේ තත්ව වාර්තාව අත්සන් කොට ඔබේ නිවෙස් හිමියාට හෝ දේපළ වෙළඳ නියෝජිතයාට භාර දෙන්න, ඔබත් පිටපතක් තබා ගන්න. සෑම කාමරයක්ම ඡායාරූපගත කරන්න.
- පිරිසිදු කිරීම් සඳහා හෝ කැඩීම්-බිඳීම් සඳහා ගෙවිය යුත්තේ කවුරුන්ද යන්න සම්බන්ධයෙන් ආරවුලක් ඇති වුවහොත් - ඔබට එය සාක්ෂ්‍යයක් ලෙස භාවිත කළ හැකිය.

## ප්‍රතිසංස්කරණ

- ඔබේ වරදින් හෝ ඔබ විසින් නිවසට කැඳවූ අයෙකු අතින් සිදු වූ හානි නොවේ නම්, සියලු අලුත්වැඩියාවන්ට ඉඩම්හිමියා/දේපල වෙළඳ නියෝජිතයා ගෙවිය යුතුය.
- අලුත්වැඩියාවන් වහා කළ යුතු ඒවා හෝ සාමාන්‍ය ඒවා විය හැකිය කළ යුතුව ඇත්තේ සාමාන්ය අලුත්වැඩියාවක් නම්, ඉඩම්හිම්යා හෝ දේපළ වෙළඳ නියෝජිතයාට ලිඛිතව දැනුම් දෙන්න, ඔවුන් එය දින 14 ක් ඇතුළත පිළිසකර කළ යුතුය. ගෑස් කාන්දුවක් හෝ වහළයේ කාන්දුවක් වැනි හදිසි ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ගෙවල් හිමියාට හෝ දේපල වෙළඳ නියෝජිතයාට කතා කරන්න - ඔවුන් මේවා වහාම පිළිසකර කළ යුතුය. ඔවුන් වහා ප්‍රතිචාර නොදැක්වුවහොත්, ප්‍රශ්නය විසඳීම සඳහා $1800ක් දක්වා වියදම් කොට එහි බිල්පත් ඉඩම්හිම්යා හෝ දේපළ වෙළඳ නියෝජිතයාට යැවිය හැකිය. ඔවුන්ට දින 14ක් ඇතුළත ඔබේ මුදල් ගෙවීමට සිදු වේ.

CONSUMER AFFAIRS VICTORIA

# වැඩිදුර උපකාර අවශ්‍යද?

*අධ්‍යයනය සඳහා වැඩි කාලයක් වැය කර කරදර වීම සඳහා අඩු කාලයක් වැය කරන්න.*

වැඩි විස්තර සඳහා හෝ යමක් වැරදුණු විට, අපේ ගෙවල් කුලියට ගැනීමේ විස්තර කියවන්න: consumer.vic.gov.au/renting නැත්නම් අපව අමතන්න: 1300 55 81 81

## දුරකථනමාර්ගික භාෂණ පරිවර්තන සේවාව

ඔබට භාෂණ පරිවර්තකයකු මාර්ගයෙන් අපව ඇමතීමට අවශ්‍ය නම්, 131 450 අමතා ඔබේ භාෂාවෙහි ඉංග්‍රීසි නම පවසන්න, ඉන් පසුව 1300 55 81 81 අමතන ලෙස භාෂණ පරිවර්තකයාට දන්වන්න.

## අන්තර්ජාතික ශිෂ්‍යයන්ට උපකාරී විය හැකි ආයතන

**ස්ටඩි මෙල්බර්න් ශිෂ්‍ය ආයතනය**
**(Study Melbourne Student Centre)**

599 Little Bourke Street, Melbourne

www.studymelbourne.vic.gov.au

studymelbourne@ecodev.vic.gov.au

**ඕස්ට්‍රේලියානු සාධාරණ කර්මාන්ත ආයතනය**
**(Fair Work Australia)**

www.fairwork.gov.au

**මෙල්බර්න් නුවර පිළිගැනීමේ කාර්යාංශය**
**(City of Melbourne Welcome Desk)**

bit.ly/Student-Welcome-Desk

**Tenants Victoria ආයතනය**

https://www.tuv.org.au

**Refuge of Hope**
(ලතින් ඇමෙරිකානු අන්තර්ජාතික ශිෂ්‍යයන් සහ සරණාගතයන් සඳහා)

www.refugeofhope.org.au

